**කුරුවිට ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------**

## **1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

### **1.1 අහිතකර මතය**

**----------------**

කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට කුරුවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### **1.2 අහිතකර මතය සඳහා පදනම**

**-----------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### **1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### **1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**-----------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි

හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,  චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,  ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන්  ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 65,924,859 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් සම්බන්ධයෙන් මුදල් පදනම මත ගිණුම් තබා තිබුණද, ඒ පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් හෙළිදරව් කර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | භාවිතා කළ ප්‍රතිපත්තිය හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල විමධ්‍යගත හා පළාත් සභා අරමුදල් මත සිදුකල කර්මාන්ත වෙනුවෙන් ලැබිය යුතු රු. 7,201,412 ක මුදල ප්‍රාග්ධන ආදායමට හා ප්‍රාග්ධන වියදමට ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල සියළුම ආදායම් හා වියදම් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල මිලදීගත් හා ඉදිකරන ලද ජංගම නොවන වත්කම් 10 කට අදාල එකතුව රු. 20,618,256 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | වර්ෂය තුල මිලදී ගත් හා ඉදි කරන ලද සියළු ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලද පොත් 213 ක වටිනාකම ගණනය කර ප්‍රාග්ධනිත කර නොතිබූ අතර, මිලදී ගත් පොත් වටිනාකම රු. 11,575 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | | වර්ෂයට අදාල නිවැරදි වටිනාකම ගණනය කර ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඈ) | ස්ථාවර තැන්පතුව කල්පිරීමේදී වාර්ෂික පොලිය එම ස්ථාවර තැන්පතුවට එකතු නොවී අදාල බැංකු ගිණුමට බැර වන නමුත් ඊට අදාල පොලිය රු. 78,750 ක් ස්ථාවර තැන්පත් ගිණුමට හර කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පොළී ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | රු. 2,400,000 ක් වූ ස්ථාවර තැන්පතුව හා ඊට අදාල වාර්ෂික පොලිය ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සියළුම ස්ථාවර තැන්පතු ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | 2021 මැයි හා ජූනි මාසවලට අදාල බදුකුලී ප්‍රමාද ගාස්තු රු. 99,472 ක් කපාහැරීමට ආණ්ඩුකාර අනුමැතිය ලැබී තිබූ නමුත් එම වටිනාකම කපාහැරීම ගිණුම්ගත කර නොතිබුණි. | | ගනුදෙනුව නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව ඉන්වෙන්ට්‍රි අයිතම අපහරණය හා වෙන්දේසි කර තිබුණද, ඒවායේ පිරිවැය අදාල ජංගම නොවන වත්කම් ගිණුම්වලින් ඉවත්කිරීමට කටයුතු නොකිරීමෙන් ජංගම නොවන වත්කම්වල වටිනාකම නිවැරදි නොවුණි. | | ප්‍රාග්ධනීත කර ඇති වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු එකතුව රු. 270,651 ක වියදම් සඳහා ණයහිමි වෙන්කර නොතිබුණි. | | උපචිත වියදම් නිවැරදිව හඳුනාගෙන ගැණුම්ගත කළ යුතුය. |

**1.7** **අනුකූල නොවීම**

**--------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

**------------------------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ----------------------- | -------------------- | ----------------- | ----------- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 115(2), (3), (4) | 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා එකතුව රු. 50,266,187 ක් වූ ණයහිමියන් සම්බන්ධයෙන් අදාල රෙගුලාසි ප්‍රකාරව කටයුතු | 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුල පැවත එන ණයහිමි ශේෂ, ආදායමට ගැනීමෙන් ණයහිමි ලේඛනයෙන් ඉවත් කිරීම පිළිබඳව මුදල් රෙගුලාසි අනුව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | |
| (ii) | මුදල් රෙගුලාසි 571 (2) | 2003 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව වටිනාකම රු. 9,146,573 ක් වූ විවිධ තැන්පතු, කර්මාන්ත තැන්පතු, ගිවිසුම් ඇප තැන්පතු සහ ටෙන්ඩර් ඇප තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තවදුරටත් ආදායමට ගත හැකි තැන්පත් සොයා බලමින්, දැනට ගත හැකි තැන්පත් ආදායමට ගැනීමේ කටයුතු කර ගෙන යනු ලබන අතර, ඉදිරියට තබා ගත යුතු ආදායම් තැන්පත් ලේඛනයේ තැන්පත් ලෙස තබන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට වගකිව යුතු නිළධාරීන් කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 90,282,746 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 94,509,380 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 10,738,768 ක වරිපනම් බදු හිඟයක් පැවතුණු අතර, ඒ තුල රාජ්‍ය ආයතන 101 කින් අයවිය යුතු රු. 422,964 ක ශේෂයක් හා පෞද්ගලික ඒකක 4978 කින් අයවිය යුතු රු. 10,315,804 ක ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රටේ පැවතුන කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන්, ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකි වූ බවත් වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන් හිඟ වරිපනම් බදු අය කිරීම සම්බන්ධව කටයුතු කිරීමට අපහසු වී ඇති බව. | හිඟ වරිපනම් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කාලීනව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 වර්ෂයේ සිට 2021 ජූනි දක්වා හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 60 කින් 10 ක් සඳහා පමණක් නෛතික කටයුතු ආරම්භ කර තිබුණි. අනෙකුත් අනවසර ඉදිකිරීම් නියමානුකූල කිරීමට හෝ ඉවත් කිරීම සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග මොනවාද යන්න විගණනයට ඉදිරිපත් නොවුණි. | අනවසර ඉදිකිරීම් 10 ක් සඳහා නඩු පවරා ඇති බවත් ඉතිරි අනවසර ඉදිකිරීම් සඳහා කඩා ඉවත් කිරීමේ නියෝග යැවූ බවත්, ඉතිරි ඒවා සඳහා නඩු පැවරීමට නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ගැසට් නොකල නිසා නොහැකි වී ඇති බව. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් පවතින නීතිරීති අනුව කටයුතු කළ යුතුය. |